# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 46 — 1973 පෙබරවාරි 09 වැනි සිකුරාද — 1973.02.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 25 | මෝස්තර ආඥපනත යටතේ නිවේදන ... — | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන ... ... | — | | |


සැලකිය යුතුයි.—අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 02 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇල්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම දහයේ සිට හතර දක්වාද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වාද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරී දිනවල සවස 3 දක්වාද, වරුවේ දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු ආඥපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් බාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## විරෝධය දැක්වීම

**පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මෙ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25 ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරණ පෝරම මගින් විරෝධතා දන්වීම් ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.**

**ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දන්වීම පිළිගෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.**

**විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.**

---

(1) වෙළඳ ලකුණේ අංකය: 34,075. (2) ලැබුණු දිනය: 1971 දෙසැම්බර් 23 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ෂෙරෙෆ්ප්කෝව් මැතිණිය (ග්‍රෙස් බෝන් ජර්මන් ක්‍රෙබිස් නමින් හඳුන්වනු ලබන) අංක 1 රූ ඩි ලා පයිත්ස්, පැරිසිය (සේන්) ප්‍රන්සය; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 48. (6) බඩු: සුවඳ කැවූ සබන්, සුවඳ ද්‍රව්‍ය, වාෂ්පශීල තෙල්, අංගරාග, හිසකෙස් ආලේප, දත් තාලේපයන්. (7) වෙළඳ ලකුණේ සටහන:

**CABOCHARD**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1972 අගෝස්තු මස 16 දින,

2-316/1—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 31,731. (2) ලැබුණු දිනය: 1969 ජූලි මස 24 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): ද වෙල්කම් ෆවුන්ඩේෂන් ලිමිටඩ් (බ්‍රිතාන්‍ය සමාගමකි), අංක 183/193, යුස්ටන් පාර, ලන්ඩනය, එන්. ඩබ්ලිව්. 1, එංගලන්තය; නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය: ජුලියස් සහ ක්‍රීසි මහතුන්, තැ. පෙ. 154, කොළඹ. (5) පන්තිය: 3. (6) බඩු: භෛෂජ්ජීය සහ ඖෂධීය නිෂ්පාදන සහ ද්‍රව්‍ය. (7) වෙළඳ ලකුණේ සටහන:

**INSTAPAR**

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1972 ජූලි මස 19 දින,

2-316/2—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය: 30,768. (2) ලැබුණු දිනය: 1968 ඔක්තෝබර් මස 17 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): නොල් ඒ. ජී. (ජර්මනියේ නීති යටතේ විධිමත්ව ලියාපදිංචි කරන ලද සමාගමකි), අංක 67, ලුඩ්විග්ෂාෆ්ප් ඇම් රීන් 2, පොස්ට්ෆැච්, ජර්මනිය; නිෂ්පාදකයෝ සහ අපනයනකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත් නම් ඒ ලිපිනය: අබේරත්න සහ අබේරත්න මහතුන්, නෙත්‍රිස් ගොඩනැගිල්ල, යෝර්ක් වීදිය, කොළඹ 1. (5) පන්තිය: 3. (6) බඩු: තෙවන පන්තියේ වැටෙන සියළුම භාණ්ඩ. (7) වෙළඳ ලකුණේ සටහන:



ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 අගෝස්තු මස 7 දින.

2-447—73.02.09 දින අංක 46 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්මගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| පෙබරවාරි | ... | 73. 2. 2 සිකුරාදා | ... | 73. 1.26 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 2. 9 සිකුරාදා | ... | 73. 2. 2 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 2.15 බ්‍රහස්පතින්දා | ... | 73. 2. 9 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 2.23 සිකුරාදා | ... | 73. 2.15 බ්‍රහස්. | දවල් 12.00 |
| මාර්තු | ... | 73. 3. 2 සිකුරාදා | ... | 73. 2.23 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 3. 9 සිකුරාදා | ... | 73. 3. 2 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 3.16 සිකුරාදා | ... | 73. 3. 9 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 3.23 සිකුරාදා | ... | 73. 3.16 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 3.30 සිකුරාදා | ... | 73. 3.23 සිකුරාදා | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාදා | ... | 73. 3.30 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 4.11 බදාදා | ... | 73. 4. 6 සිකුරාදා | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්දා | ... | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.27 සිකුරාදා | ... | 73. 4.19 බ්‍රහස්. | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.